සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2022.11.09

සියළුම පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි බැංකු/ බැංකු සමිති කළමනාකරුවන්

**<u>සමෘද්ධි බැංකු හා ක්ෂේත්‍ර ගත කාර්යය මණ්ඩල සදහා සති අන්ත දින/ රජයේ නිවාඩු දිනවල රාජකාරි වල නිරත වීම සහ දින වැටුප් ලබා දීම</u>**

රජය මගින් ලබා දුන් උපදෙස් මත වකුගඩු, ආබාධිත හා වැඩිහිටි නිත්‍ය දීමනා ලබන සහ ඔවුන් වෙත ලබා දෙන අතිරේක දීමනාව ( Top up) සමෘද්ධි බැංකු ඉතිරි කිරීමේ ගිණුමක් හරහා ලබා දීම දැනට සිදු කරයි.

02. ඒ අනුව, මෙම වැඩසටහන සම්බන්ධ ප්‍රතිලාභීන් දැනුවත් කිරීම, ලේඛණ පිළියෙල කිරීම, ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කිරීම, ගිණුම් ගත කිරීම සහ ප්‍රතිලාභ මුදල් ගෙවීම් කිරීම වැනි වැඩසටහනට සම්බන්ධිත කාර්යයන් සහ රාජකාරි එකක් හෝ කිහිපයක් සති අන්ත සහ රජයේ නිවාඩු දිනයක ඉටු කර ඇති විටක නිලධාරින්ට දින වැටුප් ලබා දීම සිදු කළ යුතු බව 2022.11.01 දින පැවැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව, 2022 නොවැම්බර් සහ දෙසැම්බර් මාස 02 සදහා බැංකු සහ ක්ෂේත්‍ර ගත නිලධාරින්ට දින වැටුප් 02 ලබා දීමට අවසර දෙනු ලැබේ. මෙහිදී දැනට ස්ථිර රාජකාරිවල නිරත ග්‍රාම නිලධාරි වසමට අමතරව තවත් ග්‍රාම නිලධාරි වසමක හෝ කිහිපයක වැඩ බලන විටකදී එක් වැඩ බලන ග්‍රාම වසමක ඉටු කරන රාජකාරි වෙනුවෙන්ද දින වැටුප් 02ක් ලබා දීමට හැක.

04. 2022 ඔක්තෝම්බර් මාසය සදහාද, ඉහත සදහන් කාර්යයක රාජකාරි ඉටු කර ඇත්නම්, එම නිලධාරින්ට දැනට ලබා දී නොමැති වීටක දින වැටුප් ලබා දීමට කටයුතු කළ යුතුය.

05. දින වැටුප් ලබා දීමේදී, රාජකාරි ඉටු කර ඇති බවට සනාථ කර ගැනිමට ඉදිරි වැඩසටහන් සහ කල වැඩසටහන් ලබා ගැනිම සිදු කළ යුතුය.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |